# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## නීති පීඨය
## නීතිවේදී උපාධි පරීක්ෂණය - පළමු වසර - (මාර්ගගත)
## 2021/2022
## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය - I
## (පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව : 06

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.
(විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ)

---

1. 'කිසියම් අසම්පූර්ණභාවයක් පැවතිය ද, 'නීතියේ ආධිපත්‍යය' පිළිබඳ මූලධර්මය රාජ්‍ය බලය නියාමනය කිරීම සහ පුද්ගල නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා තාර්කික දාර්ශනික පදනමක් සපයයි. එසේ නමුත්, මෙකී අරමුණු සහතික කිරීමෙහිලා 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය පිළිබඳ සංකල්පය' වඩාත් පුළුල් ස්වරූපයක් ගනු ලබයි.'

   ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද? ශාස්ත්‍රීය මතවාදයන් හා නඩු තීන්දු අධිකාරිය ඔස්සේ ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න.

   (ළකුණු 100)

2. සොලෝනිකා රාජ්‍යය මෑත ඉතිහාසය තුළ විදේශ සංචිත අවම වීම, උද්ධමනය මෙන්ම ආහාර නිෂ්පාදනය හා සැපයුම අවප්‍රමාණය වීම මත විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දෙන ලදී. මෙම තත්ත්වයට ප්‍රතිකර්මයක් වශයෙන්, ජනාධිපතිවරයා වෙත කඩිනමින් තීරණ ගතහැකි ආකාරයට බලය පැවරෙන පරිදි රටේ පවතින නීතින් සංශෝධනය කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත. මෙම තීරණය මත, වෙළෙඳාම, පාරිභෝගික කටයුතු සහ ආහාර සැපයීම සම්බන්ධ පනත් කිහිපයකට යම් යම් සංශෝධන සිදුකිරීමට සොලොනිකා පාර්ලිමේන්තුවට අවශ්‍ය විය. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් හි ප්‍රතිපාදන සොලෝනිකා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියෝගයට ලක්කරන ලදී. පනත් කෙටුම්පත් වල ඇතැම් විධිවිධාන සොලෝනිකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බැවින් එම විධිවිධාන ඉවත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටි අතර, යෝජිත විධිවිධානවලට වැඩිදුර නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඊට අනුකූල නොවන්නේ නම්, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් පනත් කෙටුම්පත් සම්මත කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ කළේය.

කෙසේ වෙතත්, පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ මතය වූයේ අවශ්‍ය වූ විට ජනතාව වෙනුවෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා සොලෝනිකා ජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත බලය පවරා ඇති බැවින්, ශ්‍රේෂ්ඨාධිකරණය නිර්දේශ කළ පරිදි තුනෙන් දෙකක බහුතරය අනිවාර්ය නොවන බවත්, ඒ අනුව, පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් සංශෝධන කෙටුම්පත් පාර්ලිමේන්තුවේ සරල බහුතරයකින් සම්මත කළ හැකි බවයි. පාර්ලිමේන්තුව සතු නෛසර්ගික බලය කිසිදු බාහිර ආයතනයකට කොයිම ලෙසකින් හෝ හැල්ලුවට ලක් කළ නොහැකි බව සොලෝනිකා පාර්ලිමේන්තුවේ කථානායකවරයා ද පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කළේය.

ඉහත පසුබිම් තත්ත්වය මත, අදාළ ව්‍යවස්ථාමය මූලධර්මය/මූලධර්ම සහ එහි/ඒවායේ අදාළත්වය සාකච්ඡා කරන්න. සොලොනිකා රාජ්‍යයේ ව්‍යවස්ථාමය පසුබිම් සහ සම්මතයන් ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න.

(ළකුණු 100)

3. ලාගෝස් රාජ්‍යයේ ඉඩම් අමාත්‍යවරයා වන කමල්, 'කහටවත්ත' නම් ඉඩමක් මහජන පුස්තකාලයක් ඉදිරිකිරීම සඳහා වන හදිසි අවශ්‍යතාවයක් බැව් දක්වමින් රජයට පවරාගැනීමට තීරණය කර ඇත. කෙසේවෙතත්, හදිසි අවශ්‍යතාවයක් සඳහා යැයි පවසමින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරනු ලැබූ එම ඉඩම පිළිබඳ වසර තුනකට ආසන්න කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. පසුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම ඉඩම අක්වෙරළ සමාගමක් වන ෆයිව්ස්ටාර් ලිමිටඩ් වෙත පැවරීමට නිර්දේශ කරන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන්, ඉඩම අත්පත් කරගැනීමේ මුල් අරමුණට අමතරව, ඒකී අරමුණ අවම ආකාරයකින් තෘප්තිමත් කෙරෙන ආකාරයට, අත්පත් කරගනු ලබන ඉඩමේ පාපන්දු පිටියක් ඉදි කිරීමට ෆයිව්ස්ටාර් ලිමිටඩ් සමාගම විසින් යෝජනා කර ඇත.
කැබිනට් පත්‍රිකාවක් හරහා ලාගෝස් ජනරජයේ ජනාධිපතිවරයා වන සේන ෆයිව්ස්ටාර් ලිමිටඩ් සමාගමේ යෝජිත ව්‍යාපෘතිය දැඩිව අනුමත කරන ලදී. ඉඩම පැවරීමත් සමඟ ලැබෙන විශේෂ සහන සඳහා ෆයිව්ස්ටාර් සමාගම විසින් සිදුකළ ඉල්ලීමට පක්ෂව සේන තවදුරටත් යෝජනා ඉදිරිපත් කළේය. මේ අතර, නාගරික සංවර්ධන අමාත්‍යවරයා වන මහේන්, මාධ්‍ය හමුවකදී සේන විසින් ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව අනුමත කිරීමට යාම පිළිබඳ සිය අප්‍රසාදය පල කළේය. පසු දිනයේදී අග්‍රාමාත්‍යවරයාගේ ද උපදෙස් නොමැතිව සේන විසින් මහේන් එම අමාත්‍යධුරයෙන් ඉවත් කර තම බෑනා වන තාර, නාගරික සංවර්ධන අමාත්‍යවරයා ලෙස පත් කරන ලදී. පසුව කැබිනට් මණ්ඩලය විසින් කිසිදු ප්‍රශ්නකිරීමකින් තොරව අදාළ කැබිනට් පත්‍රිකාව අනුමත කරන ලදී.

ලාගෝස් ජනරජයේ ව්‍යවස්ථාපිත පාලන ක්‍රමය ශ්‍රී ලංකාවට සමාන යැයි උපකල්පනය කරන්න. විධායක බලතල අනුසාරයෙන් මෙකී ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය සාකච්ඡා කරන්න. අවශ්‍ය අවස්ථා වලදී, ඔබේ පිළිතුර අදාළ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන, නඩු නීති අධිකාරීන් සහ ව්‍යවස්ථාපිත මූලධර්ම මත පදනම් විය යුතුය.

(ළකුණු 100)

4. සෙලෝනිකා රාජ්‍යයේ අභිනවයෙන් තේරීපත් වූ රජය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීමට තීරණය කර ඇත. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික කරුණු කෙටුම්පත් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් කමිටුව විසින් 'අධිකරණය' නමින් නව පරිච්ඡේදයක් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙත හඳුන්වා දෙනු ලබන අතර, එම පරිඡේදය තුළ අධිකරණයේ සංයුතිය, බලතල, කාර්යපටිපාටිය සහ රජයේ අනෙකුත් බලමූලායතන ද්විත්වය සමඟ අධිකරණයේ සබඳතාවය පැහැදිලි කෙරේ. මෙම පරිඡේදයේ දක්වා ඇති විධිවිධාන අනුව ඉහළ අධිකරණ වෙත විනිසුරුවරුන් පත්කිරීමේ බලතල රජයේ තනි විධායක බලය හිමි ජනාධිපතිවරයා වෙත පවරා ඇත. මෙම පරිඡේදය තුලින් තවදුරටත් යෝජනා කර ඇත්තේ ඉහළ අධිකරණ වල විනිසුරුවරුන් පාර්ලිමේන්තුව විසින් ගෙන එන ලද දෝෂාභියෝගයකින් අනතුරුව පාර්ලිමේන්තුවේ සාමාජිකයන්ගෙන් පමණක් සැදුම්ලත් කමිටුවක් මඟින් සිදු කරනු ලබන විමර්ශනයකින් පසු ඉවත් කළ හැකි බවයි. එමෙන්ම විනිසුරුවරුන්ගේ විශ්‍රාම යැමේ වයස් සීමාව ඉවත් කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක කමිටුව විසින් යෝජනා කර ඇත.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක කමිටුව විසින් ඉදිරිපත් කරන ලද සංකල්ප පත්‍රිකාවෙන් යෝජනා කරන්නේ, පහළ අධිකරණ විනිසුරුවරුන්ගේ පත්වීම්, උසස්වීම්, විනය පාලනය සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් බලතල දරන අධිකරණ සේවා කොමිෂන් සභාව, පාර්ලිමේන්තුව වෙත වඩාත් වගවීම සඳහා ප්‍රතිව්‍යුහගත කර විධිමත් කළ යුතු බවයි.

මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනා පිළිබඳව සොයා බැලීමට පත්කළ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉහත යෝජනා සහ ඒවායේ ප්‍රතිවිපාක පිළිබඳව අදහස් දැක්වීමට ඔබෙන් ඉල්ලා ඇතැයි උපකල්පනය කරන්න. එසේම සිලෝනිකා රාජ්‍යයේ ව්‍යවස්ථාමය ව්‍යුහය සහ ව්‍යවස්ථාමය සම්මතයන් ශ්‍රී ලංකාවට සමාන යැයි සිතන්න. ඉහත යෝජනා පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 100)

5. රට තුල ප්‍රකාශයට පත්කෙරෙන පුවත්පතක් වන,"සන්ඩේ මෝර්නිංග්" පුවත්පත වාර්තා කරන අන්දමට ඊයේ දිනයේ දී පාසල් ගුරු සංගම් කිහිපයක් කොළඹ දී උද්ඝෝෂණයක් හා විරෝධතා රැළියක් පවත්වා ඇත. එම පුවත් වාර්තාවේ දැක්වෙන ආකාරයට රැළියට පෙර සහ පා ගමන පවත්වන අතරතුර පොලීසිය විසින් සංවිධායකයන් වෙත දැනුම් දී ඇත්තේ රටේ පවතින සෞඛ්‍ය මාර්ගෝපදේශ හා රෙගුලාසිවලට අනුව මහජන ඒකරාශීවීම් වෙත ඉඩදිය නොහැකි බැවින්, මෙම පා ගමනට සහ රැළිය පැවැත්වීමට ඉඩ දිය නොහැකි බවයි. තමන් උද්ඝෝෂණය සංවිධානය කරනු ලැබුවේ රටේ පවතින සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව බවත්, උද්ඝෝෂණය පැවැත්වීමට එරෙහිව අධිකරණ නියෝගයක් ද නොමැති බවත් පවසමින් සංවිධායකවරුන් විසින් පොලීසියේ ස්ථාවරය ප්‍රතික්ෂේප කර ඇත.

රැළිය පැවැත්වෙමින් තිබියදී පොලිසිය එය බලහත්කාරයෙන් නවතා විරෝධතාවයේ සංවිධායකයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන් මුළු රාත්‍රිය පුරාම පොලිස් ස්ථානවල රඳවාගෙන සිට පසු දින අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත අධිකරණයෙන් ඇප ලබාදී ඇත. විරෝධතාවයට සහභාගී වූ කිහිප දෙනෙකුට පොලීසිය විසින් පහර දීමෙන් පසුව ඔවුන් රෝහල් ගත වී ඇති බවට ද පුවත්පත් වාර්තාවේ තවදුරටත් සඳහන් වේ. කෙසේ වෙතත්, පහරදීමේ චෝදනාව පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරයි.

මෙරට ස්වේච්ඡා සංවිධානයක් වන 'නිදහස්-හඬ' එම පුවත්පත් වාර්තාව හා සමාජ මාධ්‍ය හරහා හුවමාරු වූ වාර්තා කිහිපයක් අධ්‍යයනයෙන් පසු මෙම සිද්ධිය සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් කඩවීමේ නඩුවක් ගොනු කිරීමට තීරණය කරයි. නඩු පැවරිය හැක්කේ කෙසේද යන්න පිළිබඳව ඔවුන් ඔබේ මතය විමසයි. මේ අතර, අසත්‍ය තොරතුරු පළ කර පොලිසිය අපකීර්තියට පත් කිරීම සම්බන්ධයෙන් එම පුවත්පතට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට පොලිසිය අපේක්ෂා කරයි.

ඉහත තත්ත්වය පරීක්ෂා කර ඊට අදාළ නීති තත්ත්වය සහ නඩු නීතිය පැහැදිලි කරමින් වාර්තාවක් ලියන්න.

(ළකුණු 100)

6. පහත දැක්වෙන **<u>ඕනෑම ප්‍රශ්න දෙකකට (02)</u>** ට පමණක් පිළිතුරු සපයන්න.

(අ). ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවසන් සංශෝධන ද්විත්වය මඟින් ජනාධිපතිවරයාගේ විධායක බලය සැලකිය යුතු ලෙස අඩුකිරීමේ අවශ්‍යතාවය සහ පාලනය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීමට හා ස්වාධීන ආයතන හා කොමිෂන් සභා දේශපාලනීකරණයෙන් ඉවත් කිරීම සහතික කිරීමේ අවශ්‍යතාවය කෙතරම් දුරට ආමන්ත්‍රණය කරන්නේ ද යන්න සාකච්ඡා කරන්න.

(ළකුණු 50)

(ආ). විවිධ පාලන මට්ටම් වල ක්‍රියාත්මක වන විවිධ මැතිවරණ ක්‍රම ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ළකුණු 50)

(ඇ). 'සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ආගමික නිදහස භුක්ති විඳීම උල්ලංඝනය කරන නීති සහ එක් ප්‍රජාවකට හෝ ආගමික කණ්ඩායමකට තවත් ප්‍රජාවකට හෝ ආගමික කණ්ඩායමකට වඩා වරප්‍රසාද හිමිවන හෝ අවාසිදායක වන නීති පැනවීම තහනම් කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය සහ ප්‍රිවි කවුන්සිලය ද ස්වකීය තීරණවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරන නීතින් අවලංගු කිරීමට පසුබට නොවීය.'

උක්ත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ළකුණු 50)

*******************